1st Place Winner
National Productivity
Award 2020

ISO 9001
SLAB ACCREDITED
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/06/03/04/2022(216) | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2023.03. 30 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**වාර්ෂික ස්ථාන මාරු - 2022**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ අංක CSS/03/06/03/04/2022(212) හා 2023.01.24 දිනැති ලිපිය හා බැඳේ.

02. එකී ලිපිය මගින්, මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ අංක EC/EDR/LAE/2023/04 B හා 2023.01.05 දිනැති අංක 20 දරණ චක්‍රලේඛය මගින්, ඡන්ද විමසීම් පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ඡන්ද විමසීම් රාජකාරි සඳහා යොදවා ගැනීමට අපේක්ෂිත රජයේ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් 2023.01.18 දින සිට 2023.03.20 දින දක්වා අත්හිටුවිය යුතු බව දැනුම් දී ඇති බැවින්, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි 2023.01.31 දිනට ක්‍රියාත්මක වීමට නියමිත 2022 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු සියල්ල 2023.03.31 දක්වා කල් දැමීමට කටයුතු කරන ලදී.

03. ඒ අනුව, මේ සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය විමසන ලදුව, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක EC/SO/LAE/2023/4C (ii) හා 2023.03.29 දිනැති ලිපිය මගින් දකුණු පළාත් සභාවේ සේවයේ නියුතු කළමනාකරණ සේවා නිලධාරී/ සංවර්ධන නිලධාරී/ සංවර්ධන සහකාර/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර/ රියදුරු/ කාර්යාල සේවක සේවය යන සේවාවන්හි නිරත නිලධාරීන්ගේ 2022 වාර්ෂික ස්ථාන මාරුවීම් 2023.04.03 දින සිට ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී ඇත.

04. එබැවින්, 2022 වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීම යටතේ 2023.03.31 දින දක්වා දීර්ඝ කරන ලද ඉහත සඳහන් සේවාවන්හි සේවයේ නියුතු නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් **2023.04.03** දින සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස කාරුණික ව දන්වා සිටිමි.

05. තවද, ඔබ අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් සියලුම ආයතනවල නිලධාරීන් වෙත ද මේ සම්බන්ධයෙන් නොපමාව දැනුම් දීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

**සුමිත් අලහකෝන්,**
**ප්‍රධාන ලේකම්,**
**දකුණු පළාත.**

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2234052
ෆැක්ස් / பெக்ஸ் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site: www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල.
Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"